**මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ආර්එන්අයිපී) - 2013**

**------------------------------------------------------------------**

මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (ආර්එන්අයිපී) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ආසියානු සංවර්ධන බැංකුව (ඒඩීබී) සහ මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) අතර 1999 ජනවාරි 28 දින එළඹි අංක 1649 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ II වාවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------**

මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය (මාසඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයයි. මාර්ග පසුකරන ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදෙමින් සුදුසු උපාය මාර්ගික මාර්ග ජාලයන් සපයා නඩත්තු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රධාන අරමුණුවලට අමතරව ජලගැල්මෙන් හානියට පත්වන යටිතල පහසුකම් හා විශේෂයෙන් ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථික සමාජ ක්‍රියාකාරකම් කඩිනමින් ගොඩනැංවීම සඳහා වූ රජයේ පුනරුත්ථාපන වැඩසටහන්වලට සහායවීම අනෙකුත් අරමුණුවේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,564 ක් වන අතර ඉන් රු.මිලියන 6,933 කට සමාන එ.ජ.ඩො මිලියන 92.5 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ විය. ව්‍යාපෘති කටයුතු 1998 ආරම්භ කළ අතර 2008 දෙසැම්බර් 31 දින නිමකිරීමට අපේක්ෂා කෙරුණි. පසුව ණය සපයන නියෝජිතායතනය විසින් ව්‍යාපෘතියේ කාලය 2009 අප්‍රේල් දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිතා කරමින් ව්‍යාපෘතියේ කටයුතු 2013 දෙසැම්බර් 31 දක්වා සිදුවෙමින් පැවතුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනිමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂයපථය සහ මතය සඳහා පදනම

---------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම්ද, එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලැබුණු අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණේද යන බව හා

(උ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණේද යන බව.

## 3. මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

## 4 මූල්‍ය ප්‍රකාශන

----------------

### 4.1 මූල්‍ය කාර්යසාධනය

-------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වියදම රු. 11,043,208 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 17,606,263,855 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013<br>රු. | 2012<br>රු. | රු. |
| ස්ථාවර වත්කම් ලියාහරින ලද වටිනාකම (මා.ස.අ.මාරු කිරීම්) | - | - | 12,435 |
| සම්පූර්ණ කරන ලද සිවිල් වැඩ | 4,958,336 | 308,848,100 | 14,452,576,790 |
| කෙරීගෙන යන වැඩ | 3,773,224 | - | 2,412,416,045 |
| ව්‍යාපෘති පරිපාලනය | - | (280,333,708) | 671,845,522 |
| ඉඩම් අත්පත් කරගැනීම | 2,311,648 | 1,928,023 | 69,413,063 |
| | 11,043,208 | 30,442,415 | 17,606,263,855 |

## 4.2 අග්‍රිම අරමුදල

----------------

2009 අප්‍රේල් 30 දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ අග්‍රිම අරමුදල් ගිණුම් 2 ක් ක්‍රියාත්මක විය. ඉන්පසු විදේශීය අරමුදල් ලැබී නොතිබූ අතර අග්‍රිම අරමුදල් ගිණුමේ ශේෂයක්ද නොවීය.

## 5 විගණන නිරීක්ෂණ

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කරනු ලැබුවද රු.62,425,145 ක වියදමින් ව්‍යාපෘති කාලය තුළ මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීමට ව්‍යාපෘතිය විසින් ක්‍රියාකර නොතිබුණු අතර අග්‍රිමය පියවීමේ කාලපරිච්ඡේදයද 2009 අප්‍රේල් 30 දින නිම විය. තවද වටිනාකම රු.13,189,007 ක් වූ ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ව්‍යාපෘතිය සමඟ සෘජු සම්බන්ධතා නොමැති වෙනත් ආයතන සතුව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂයේ ව්‍යාපෘතිය විසින් විදේශ සංචාරයක් සඳහා ලබා දෙනු ලැබූ රු.233,500 ක අත්තිකාරම 2013 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කර නොතිබුණි. තවද තෙවන පාර්ශවයක් විසින් දේපල අලාභ මත රු.113,977 ක හිමිකම්පෑමක් වසර 5 කට අධික කාලයක් නිරවුල් නොවී පැවතුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

----------------------------------

## 6.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ වසර අවසානයේදී අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂයේ අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආසබැ | 92.5 | 6,933 | - | - | 9,629 |
| ශ්‍රී ලං ර | - | 2,631 | 13.1 | 11.3 | 7,977 |
| එකතුව | 92.5 | 9,564 | 13.1 | 11.3 | 17,606 |

## 6.2 මාර්ග වැඩිදියුණු කිරීමේ කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කරගැනීම

---------------------------------------------------------------------------

විධිමත් සැලසුම්කරණයක් නොමැතිවීම නිසා ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යයන් නියමිත වෙලාවට සම්පූර්ණ කර නොතිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මාර්ග ඉදිකිරීම් සැලැස්මට අනුව, ව්‍යාපෘතිය යටතේ මාර්ග වැඩිදියුණු කිරීමේ කාර්යයන් සඳහා ඉඩම් කොටස් 18,688 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කෙරුණි. කෙසේ වෙතත්, 2013 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 18,638 ක් අත්පත් කරගෙන තිබුණි. ඉහත අත්පත් කරගත් ඉඩම් කොටස් වලින්, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය අනුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී තිබුණේ ඉඩම් කොටස් 12,204 ක් පමණි.

(ii) ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීමේ කාර්යයන් සම්බන්ධයෙන් ලැබී ඇති තොරතුරු වලට අනුව ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව (එල්ඒආර්සී) ලබාදුන් තීරණ යටතේ රු.2,261,397,428 ක මුදලක් වන්දි ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2013 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 12,641 කට අදාළව වන්දි ගෙවීමේ ප්‍රමාදය මත එකතුව රු.128,962,516 ක පොලී මුදලක් ගෙවා තිබූ අතර වන්දි ගෙවීම් නිරවුල් කිරීමේදී අමතර පිරිවැය මඟහැරවීමට ව්‍යාපෘතිය අර්ථදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බව පෙන්නුම් කෙරුණි.

(iii) සපයන ලද තොරතුරුවලට අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ මතභේද තිබූ නිසා 2013 දෙසැම්බර් 31 අවසානයට වන්දි ගෙවීම් සම්පූර්ණ කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| **මාර්ගය** | **2013 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීමට තිබුණු ආරාවුල් සහිත ඉඩම් කොටස් ගණන** |
|---|---|
| කටුගස්තොට - කුරුණෑගල | 39 |
| පානදුර - ඉංගිරිය | 05 |
| අම්බලන්ගොඩ -ඇල්පිටිය | 04 |
| පස්යාල - මීරිගම | 07 |
| කටුගස්තොට - වත්තේගම | 14 |
| එකතුව | 69 |

## 7. ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම

---------------------------------------

මූලික සැලැස්මට අනුව රු.මිලියන 7,335 වියදමින් කිලෝමීටර 261.8 ක් දිග මාර්ග 18 පුනරුත්ථාපනය කිරීමට මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන සහ ලද අනෙකුත් තොරතුරුවලට අනුව ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල් භාවිතා කරමින් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය වැඩසටහන් යටතේ පසුව සම්පූර්ණ කරන ලද බී 205/369 කටුගස්තොට - වත්තේගම පාර (කි.මී 9.8) සහ ඒ් 010 කටුගස්තොට - කුරුණෑගල පාර (කි.මී 37.8) පුනරුත්ථාපනය කිරීම හැර 2012 වර්ෂය අවසානයට රු.මිලියන 10,625 ක වියදමින් දිග කි.මී 312 ක මාර්ග 23 ක් සම්පූර්ණ කර තිබුණි. මාර්ග වැඩිදියුණු කිරීමේ අතිරේක ප්‍රමාණයන්, අමතර වැඩ, වැඩ උච්චාවචනයන් ආදීය නිසා ව්‍යාපෘතියේ මූලික ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 8,042 කින් වර්ධනය වී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. මූලික කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය මාස 67 දක්වාද දීර්ඝ කර තිබුණි. සියළුම සුදුසුකම්ලත් වියදම් වලට හිමිකම්පෑම් කර තිබූ අතර 2009 මැයි මාසයේදී උපදේශකයින් විසින් ව්‍යාපෘති නිමවුම් වාර්තාද ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය ලෙස ව්‍යාපෘතියේ ගිණුම් වසා දැමීමට සහ ව්‍යාපෘතියේ වත්කම් සහ වගකීම් භාරගැනීමට ක්‍රියාකර නොතිබුණි.